# තේ වතු කම්කරු කුටුම්භවල ආර්ථික පසුබිම පිළිබඳ අධ්‍යයනයක්

බී.පී.ටී.ඩී.බණ්ඩාර

*සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය*
bandarathusithad@gmail.com

***සංක්ෂේපය***

*ශ්‍රී ලංකා ආර්ථිකයේ ඉහළ ම විදේශ විනිමයක් අඛණ්ඩව උපයන ක්ෂේත්‍රය ලෙසත් ඉහළ ම කාන්තා සේවා නියුක්තිය පවතින ක්ෂේත්‍රය ලෙසත් තේ කර්මාන්තය හඳුනාගත හැකි ය. නමුත් එම ක්ෂේත්‍රයේ ප්‍රධාන දායකත්වය දක්වන තේ වතු කම්කරු කුටුම්භ, ශ්‍රී ලංකාව තුළ ඉහළම දරිද්‍රතාවයෙන් පෙළෙන අතර එම කුටුම්භවල ආර්ථික පසුබිම කුමන ආකාරයෙන් සමන්විත වන්නේ ද යන්න මෙම අධ්‍යයනයේ ගැටලුව වේ. මෙම අධ්‍යයනයේ අරමුණ, තේ වතු කම්කරු කුටුම්භවල ආර්ථික පසුබිම හඳුනාගැනීමයි. මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය දත්ත, බහුපිය පොකුරු නියැදීම තුලින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රේග්ලී වතුයායේ කුටුම්භ 100 කින් යුත් නියැදියක් මගින් රැස් කරගන්නා ලදී. ඒ සඳහා මූලිකවම ප්‍රශ්නාවලි ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතා කර ඇත. දත්ත ඉදිරිපත් කිරීම සඳහා වගු සහ ප්‍රස්තාර සටහන් භාවිතා කර ඇති අතර දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යානමය විශ්ලේෂණ ක්‍රමවේද යොදා ගන්නා ලදී. තේ වතු කම්කරු කුටුම්භවල සාමාන්‍ය සාමාජික සංඛ්‍යාව 5 ක් ද ඒ අතුරෙන් ස්ථිර තේ වතු කම්කරුවන් ලෙස සාමාන්‍යයෙන් සාමාජිකයන් දෙදෙනෙකු සේවා නියුක්ත වන අතර කුටුම්භ මූලික ආර්ථිකය ඒ තුලින් නිර්මාණය වේ. කුටුම්භ ආර්ථිකය සඳහා මූලිකවම පදනම්වන්නාවූ දෙමාපිය අධ්‍යාපනය, ඉතා පහළ මට්ටමක පවතින අතර කුටුම්භ 13% ක දෙමාපියන් කිසිදාක පාසල් අධ්‍යාපනය ලබා නොමැති අතර 8 ශ්‍රේණිය තුළ දී 87%ක් පමණ පාසල තුලින් විතැන්ව ඇත. මෙම ආර්ථිකය තම කුටුම්භය සඳහා ප්‍රමාණවත් නැත යන සංකල්පය මත 89%ක් පමණ කුටුම්භ අමතර ආදායම් මාර්ග වෙත යොමු වී ඇත. වතු ක්ෂේත්‍රය තුළ දී දෛනික කටයුතු සඳහා අවශ්‍ය ණය ගනුදෙනු සිදු වේ. වතු ක්ෂේත්‍රයේ කුටුම්භ මාසික වියදම, කුටුම්භ අධ්‍යාපන වියදම මත එකිනෙකින් මූලිකවම වෙනස් වේ. ඒ අනුව වතු අංශයේ අඛණ්ඩ දරිද්‍රතාවය පිටුදැකීම සඳහා අධ්‍යාපනික පහසුකම් වැඩිදියුණු කිරීම සහ රජය මැදිහත්ව එම සමාජයේ ආකල්ප සංවර්ධනය කල හැකි ය. තේ වතුකරය තුළ පවතින අමතර ආදායම් ඉපයීමේ ක්‍රම සංවර්ධනය කල යුතු අතර ජීවන වියදමට සරිලන පරිදි වතු කම්කරු දෛනික වැටුප රු. 1000/= ක් දක්වා ඉහළ නැංවීම තුලින් වතු සමාජයේ ආර්ථික හා සමාජයීය පසුගාමීත්ව තත්ත්වය වෙනස් කල හැකි වේ.*

**මුඛ්‍ය පද :** ආර්ථිකය, කුටුම්භ, දරිද්‍රතාවය, වතු කම්කරුවන්

## 1. හැඳින්වීම

1815 දී ශ්‍රී ලංකාව මුලුමනින්ම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට යටත්වීමත් සමඟ වාණිජ වතු වැවිලි වගාව සීඝ්‍රයෙන් මෙරට ව්‍යාප්ත වීම සිදුවේ. 1830-1880 කාලය තුළ බ්‍රිතාන්‍යයන් කෝපි වගාව සඳහා සිය මූලික අවධානය යොමු කල අතර මෙම කාලය කෝපි යුගය ලෙස හැඳින්වේ. 19වන සියවසයේ අග භාගයේ කෝපි වගාවේ පරිහානියත් සමඟ සිංකෝනා, තේ, පොල්, රබර් වගාවන් වෙත යොමුවුණි (පියරත්න, 2005).

මුල් අවධියේ දී තේ සහ රබර් වගාවට අවශ්‍ය කම්කරුවන් වතු ආසන්න ගම්වලින් සොයා ගැනීම සිදුවූ නමුත් සාම්ප්‍රදායික ඉඩම් භුක්තිය පදනම් කරගෙන සංවිධානය වූ සමාජයක් සහිත ලංකාව තුළ වතු වගාව සඳහා ප්‍රමාණවත් කම්කරු ශ්‍රමය ලබාගැනීම දුෂ්කර විය. මෙම ගැටලුව විසඳා ගැනීම සඳහා විවිධ නෛතික පියවර යෙදවීමට රජයට සිදුවිය. 1832 දී සිදුකළ රාජකාරි ක්‍රමය අහෝසි කිරීම, 1870 දී සේවය සඳහා ප්‍රමාණවත් මුදලක් ගෙවීමේ ක්‍රමයක් නීති ගත කිරීම මේ සඳහා අනුගමනය කළ පියවර දෙකකි. මේ ආකාරයට තේ වතු ක්‍රමය සහ සේවක වැටුප් ගෙවීම ආරම්භ විය. 1980 දශකයේ අග භාගය පමණ වනවිට මෙම තත්ත්වය වෙනස් වෙමින් සේවක වැටුප් පියවීමට පවා නොහැකිව දැඩි අර්බුදයකට වතු ක්ෂේත්‍රය මුහුණ දෙන්නට විය. මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා තේ වතු පෞද්ගලීකරණය කිරීම 1990 දශකයේ දී ආරම්භ විය. ඒ අනුව තේ වතු තුළ සංවිධානය වී පැවති වෘත්තීය සමිති සමඟ පෞද්ගලික වතු ව්‍යවසායකයින් 1998 වර්ෂයේ දී ප්‍රථම සාමූහික ගිවිසුම අත්සන් තබන ලදී. මෙම ගිවිසුම මගින් තේ වතුවල ක්‍රියාපටිපාටිය, සේවය සැපයීම සඳහා ලබා දිය යුතු දින ගණන, සේවක වැටුප ආදිය පිළිබඳව එකඟතාවයකට පැමිණ ඇත (සිරිවර්ධන, 2000).

ඒ අනුව වර්ෂ දෙකකට වාරයක් සාමූහික ගිවිසුම අත්සන් කරන ලද අතර වර්තමානය සඳහා 2019 වර්ෂය දී, තේ වතු කම්කරු වෘත්තීය සමිති සහ ලංකා හාම්පුතුන්ගේ සංගමය අතර අත්සන් කරන ලද සාමූහික ගිවිසුම බලපැවැත් වේ. සේවා නියුක්ත කාන්තාවන් පෙ.ව. 7.30 වනවිට සේවය සඳහා වාර්තා කල යුතු අතර ප.ව 4.30 වනවිට දළු නෙලීම හමාර කල යුතු ය. පුරුෂ පාර්ශවය පෙ.ව. 7.30 වනවිට සේවාව සඳහා වාර්තා කලයුතු අතර පස්වරු 12.30 වනවිට සේවාව නිම වේ. අත්සන් කරන ලද නව සාමූහික ගිවිසුමට අනුව මූලික දෛනික වැටුප රු. 500 සිට රු. 700 දක්වා රු. 200 කින් සහ මිල දර්ශක දීමනාව රු. 30 සිට රු. 50 දක්වා රු. 20 කින් වැඩි කර ඇත. නමුත් මේ දක්වා කරන ලද පැමිණීමේ දීමනාව සහ දිරි දීමනාව අහෝසි කර ඇත. ඒ අනුව වර්තමානය වන විට වතු කම්කරුවකු සඳහා රු. 750 කට ආසන්න දෛනික වැටුපක් ගෙවනු ලැබේ (Sinnathamby & Vijesandiran, 2018). තව ද තේ වතු කම්කරු කුටුම්භයන් එම වෘත්තියට අමතරව සත්ත්ව පාලනය, ගෙවතු වගා සහ තාවකාලික රැකියා සඳහා යොමු වී ඇත.

පවුලේ ආදායම, ග්‍රාමීය සහ වතු ප්‍රදේශවල අවම වීමත්, වතු කම්කරු සේවක වැටුප් විෂමතාවයනුත් පවුලේ ආර්ථිකයට මූලිකව ම බලපාන බව හඳුනාගෙන ඇත. මේ නිසා දරුවන් පාසල් හැරයාමට පෙළඹීමත්, ළමා ශ්‍රමිකයින් බිහිවීමත් සිදුවේ. (UNICEF Sri Lanka, 2013). වතු කම්කරු පන්තියේ දෙමාපියන්ගේ ආදායම රැඳී පවත්නා, රැකියාවෙන් ලැබෙන අවම වේතනයන් හේතු කොටගෙන දරුවන් අධ්‍යාපනය තුලින් ඉවත් වේ (රත්නායක, 2016). වතුකරයේ ආර්ථික හා අධ්‍යාපන පසුබිම මත පදනම්ව ඔවුන් ජාතිවාදී දේශපාලනයෙහි සිරකරුවන් වීම, සමාජයීය වශයෙන් පසුගාමීත්වය, ආකල්පමය වශයෙන් නව්‍යකරණය නොවීම ආදී ගැටලු රැසකට මුහුණ පා ඇත. මෙම තත්ත්වය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී, වතු කම්කරු කුටුම්භ ආර්ථිකය පිළිබඳව අධ්‍යයනය කිරීම වර්තමානයේ දැඩි අවශ්‍යතාවයක් බවට පත්ව ඇත.

## 2. සාහිත්‍ය විමර්ශනය

මෙරට සිදු වූ ඉඩම් ප්‍රතිසංස්කරණයන්ට පෙරාතුව වතුකම්කරුවන්ගේ නිවාස, සෞඛ්‍ය, අධ්‍යාපනය යනාදී පහසුකම් පිළිබඳව කිසිවෙක් ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුනත් ප්‍රතිසංස්කරණවලින් පසු වතු කම්කරුවන්ගේ මූලික පහසුකම් වර්ධනය කිරීමට කටයුතු යොදන ලදී (පියරත්න, 2005). තේ වතු ක්ෂේත්‍රයේ වැඩි පිරිසක් අධ්‍යාපනය ඉතා අඩු වයස් සීමාවක දී අවසන් කරයි. බොහෝමයක් දෙනාට අවශ්‍ය වී පවතිනුයේ ආහාර ප්‍රශ්නයට විසඳුමක් සෙවීම මිස අධ්‍යාපනය ලැබීම නොවේ. බහුතර පිරිමි දරුවන් වයස අවුරුදු 15 සහ 16 වන විට මුදල් ඉපයීමේ පරමාර්ථයෙන් පසුවෙයි. සේවාවේ ස්වාභාවය අනුව වැඩ කරන පැය ගණන සහ වැටුප වෙනස් වේ. නමුත් මෙම වැටුප ඔවුනට ඉතා අල්ප වන අතර ණය නොවී ජීවත්වීමට මේ සියලුම නිවැසියන් අසමත් වෙති. ඉගෙනුම ලබන දරුවන් සිටින නිවෙසියන් මෙම තත්ත්වය තුළ වඩාත් අපහසුතාවයකට පත්වේ (ජයවර්ධන, 2008).

ඉතිරිකිරීම් හා ණය ගැනීම් යන අංශ ද්විත්වය ම නොමැති කුටුම්භ වැඩි ප්‍රතිශතයක් වතුකරය තුළ පවතී. විශේෂයෙන්ම ප්‍රධාන සාමාජිකයන් විශ්‍රාමික වූ පවුල්වල මෙම ලක්ෂණය දක්නට ලැබේ. සෙසු ණය එදිනෙදා අවශ්‍යතා සඳහා ගත් ඒවා ය. කාන්තා සමිති ක්‍රියාත්මක වන අතර සීට්ටු ක්‍රමය ද ඉතිරිකිරීමේ ක්‍රමයක් ලෙස හඳුනාගත හැකිවිය. මෙහි දී සාමාජිකයන් 10 ක් ඒ සඳහා යොදාගෙන ඇත. කාන්තාවන් විසින් පවුලේ ආර්ථික මට්ටම ඉහළ නංවා ගැනීම සඳහා විශාල මෙහෙයක් සිදුකරන අතර ඔවුන්ගේ ආභරණ සුරක්ෂිතව තබා අවශ්‍ය අවස්ථාවල දී උකස් කිරීම මගින් හදිසි මුදල් අවශ්‍යතා සපුරාගනු ලබයි (ජයවර්ධන, 2008). 1995 දී පැවැත්වූ සිව්වන ජාතික පෝෂණ හා සෞඛ්‍ය සමීක්ෂණය තුලින් අනාවරණය වූයේ වතු ආශ්‍රිතව වාසය කරන ගර්භණී මවුවරුන්ගෙන් 58.6% ක් සතුව BMI දර්ශකය 18.5 ට අඩුවෙන් පවතින බවයි. නියැදියෙහි ගර්භණීය කාන්තාවන් 58.3% ක් නීරක්ති රෝගයෙන් පෙළෙන බව අණාවරණය වී ඇත. මෙම ප්‍රතිඵල තුලින් හෙළි වන්නේ දෛනික දළු නෙළීමේ කාර්යය සඳහා නීරක්තිය සෘජුවම බලපාන බවයි. නොසැලකිලිමත්කම, දරිද්‍රතාවය, දුර්වල ආහාර පුරුදු, අඩු අධ්‍යාපන මට්ටම මෙම රෝගය ඇතිවීම කෙරෙහි හේතුවන බව ද මෙම සමීක්ෂණයෙන් අනාවරණය විය (Selvarathnam & Pathmeswaram, 2003).

අනෙකුත් ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවලට වඩා වතු අංශයේ දරිද්‍රතාව ඉහළ අගයක් තුළ පවතී. සාමාන්‍යය ජීවිතයක් ගත කිරීමට මාසයක් සඳහා අවශ්‍ය සාධාරණ ජීවන වැටුප සහ වර්තමාන වැටුප අතර පරතරයක් ඇති බව සඳහන් කළ හැකි ය. සමහර තේ වතු වල ජීවන වැටුප අර්ධ වශයෙන් අවම කරනු ලබන්නේ පොදු සහ පෞද්ගලික ආකාරයේ වටිනාකමක් ලබා දෙමිනි. නිවාස පහසුකම් සහ නොමිලේ ලබාදෙන සෞඛ්‍යය සායන ඒ සඳහා නිදසුන් වේ. 2015 දෙසැම්බර් සඳහා වතු අංශයේ ශුද්ධ ජීවන වැටුප රු. 19,126.00 ( $ 132) ක් පමණ වේ. මාසයක් තුළ දින 25ක් වැඩ කරන කම්කරුවෙකු සඳහා දිනකට රු. 765.00 ක ගෙවීමක් අවශ්‍යය වේ. මාසික වැටුප තුලින් පොදු, අනිවාර්යය කපා හැරීම් තුනක් හඳුනාගත හැකි ය. එනම්, සේවක අර්ථසාදක අරමුදල, ආගමික කටයුතු සඳහා කෝවිල් අරමුදල සහ වෘත්තීය සංගම් සඳහා ගෙවීම ය. මෙම කපා හැරීම්, ගැළපීම් කල විට දළ ජීවන වැටුපහි වටිනාකම රු. 21,115.00 ($ 147) ට සමාන වේ. ඒ අනුව මාසයක් සඳහා වැඩකරන කම්කරුවකුගේ

වැටුප, දිනයක් සඳහා රු. 845.00 ($ 5.89) ට සමාන විය යුතු ය (Thibbotuwawa, Jayawardhana, Arunithilake, Gunasekara & 2015).

තේ වතු කම්කරු කුටුම්භයක සාමාන්‍ය සාමාජික සංඛ්‍යාව 4 ත් 5 ත් අතර වේ. ඉන් පූර්ණ කාලීන සේවානියුක්තිකයන් ලෙස ආසන්න වශයෙන් කුටුම්භ සාමාජිකයන් දෙදෙනෙකු සේවානියුක්ත වේ. සේවා ගිවිසුම පරිදි එක් කම්කරුවෙකුට මාසයක් සඳහා දින 25 ක සේවාවක් සැපයීමට අවස්ථාව ලබා දිය යුතු ය. නමුත් තේ වතුවල වැටුප් ප්‍රවණතාවය, වතු කම්කරුවන් මාසයක් තුළ සේවය සඳහා පැමිණි දින ගණන මත පදනම්ව දෛනික වැටුප් අනුපාතය ගෙවනු ලැබේ. මුළු මාසික වැටුප මූලික වශයෙන් මූලික දෛනික වැටුප, නිෂ්පාදන දිරි දීමනා, දෛනික වැඩ සම්මතයන් සම්පූර්ණ කිරීම සඳහා ගෙවීම සහ මිල කොටස් අතිරේක ගෙවීම් තුලින් සමන්විත වේ. මෙතුලින් අනිවාර්ය අඩු කිරීම් ලෙස සේවක අර්ථසාදක අරමුදල, කෝවිල් අරමුදල සහ වෘත්තීය සංගම් අරමුදල යනාදිය පවතී. ඒ අනුව කම්කරු මුළු දෛනික වැටුප රු. 805/= ලෙස දැක්වේ. තේ වතු කම්කරුවකු සඳහා වර්තමානයේ රු. 18,250/= ක මාසික වේතනයක් ගෙවනු ලැබේ. ඒ අනුව දළ මාසික මුදල් වැටුප රු. 20,477/=ක් ලෙස පවතී. තේ වතු කම්කරුවන්ට තම පවුල සමඟ යහපත් ජීවන තත්ත්වයක් පවත්වා ගැනීමට, එනම් සාමජිකයන් 4 ත් 5 ත් අතර ප්‍රමාණයක කුටුම්භයක් සඳහා සාමාන්‍ය ලෙස ජීවත්වීමට අවශ්‍ය මාසික ආදායම රු. 44,711/= ක් පමණ වේ. මෙම තත්ත්වය තුළ එක් කම්කරුවෙකු සඳහා මාසිකව රු. 26,934/= ක වැටුපක් ලැබිය යුතු ය. එනම් වර්තමානය තුළ කම්කරුවාට හිමිවනුයේ, ඇස්තමේන්තුගත ආදායමට වඩා 26% ක ප්‍රමාණයකින් අඩු වැටුපකි. මෙම වැටුපෙන් අනිවාර්ය අඩුකිරීම් ඇතුලුව සියලු අඩුකිරීම් ඇස්තමේන්තු කල විට කම්කරුවකු සඳහා මාසික වැටුප, වර්තමාන රු. 18,250/= වැටුප් තලයේ සිට රු. 27,707/= ලෙස සංශෝධනය වියයුතු අතර දෛනික වැටුප රු.750/= සිට රු. 1,108/= දක්වා ඉහළ නැංවිය යුතු ය (Sinnathamby and Vijesandiran, 2018).

*වගුව 1 - තේ වතු කම්කරුවන්ගේ දෛනික වැටුප් වැඩිවීම*

| වසර | මූලික දෛනික වැටුප (රුපියල්) | මිල දර්ශක දීමනාව (රුපියල්) | දිරි දීමනාව සහ පැමිණීමේ දීමනාව (රුපියල්) | මුළු දෛනික වැටුප (රුපියල්) |
|---|---|---|---|---|
| 2010 | 285.00 | 30.00 | 90.00 | 405.00 |
| 2011 | 380.00 | 30.00 | 105.00 | 515.00 |
| 2012 | 380.00 | 30.00 | 105.00 | 515.00 |
| 2013 | 450.00 | 30.00 | 140.00 | 620.00 |
| 2014 | 450.00 | 30.00 | 140.00 | 620.00 |
| 2015 | 450.00 | 30.00 | 140.00 | 620.00 |
| 2016 | 500.00 | 30.00 | 200.00 | 730.00 |
| 2017 | 500.00 | 30.00 | 200.00 | 730.00 |
| 2018 | 500.00 | 30.00 | 200.00 | 730.00 |
| 2019 | 700.00 | 50.00 | 0.00 | 750.00 |

මූලාශ්‍රය : https://www.bbc.com/sinhala/sri-lanka-47391320

මේ අනුව නව ගිවිසුම පරිදි තේ වතු කම්කරුවන් සඳහා ලබාදෙන මූලික දෛනික වැටුප රු.200.00/කින් සහ මිල දර්ශක දීමනාව රු. 20.00/= ක් දක්වා ඉහළ ගොස් ඇත. එ අනුව මුළු දෛනික වැටුප රු. 750.00/= ක් වේ. නමුත් මෙම ගිවිසුම තුලින් දිරි දීමනාව සහ පැමිණීමේ දීමනාව අවලංගු කර ඇත. එම නිසා නව වැටුප් වැඩි වීමෙහි ශුද්ධ වෙනස රු. 20 ක් පමණි.

### 3. අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික සහ ද්විතීයික යන දත්ත දෙවර්ගයම රැස්කිරීම සිදුකරන ලදී. ක්ෂේත්‍ර සමීක්ෂණය සඳහා නියැදිය සකස් කර ගැනීමේ දී බහුපිය පොකුරු නියැදීම භාවිතා කර ඇත. ප්‍රාථමික දත්ත ලබා ගැනීම සඳහා මූලිකවම ප්‍රශ්නවලි ක්‍රමය භාවිතා කරන ලදි. එසේම ද්විතීයික දත්ත මාතෘකාවට අදාළව සිදුකරන ලද පූර්ව පර්යේෂණ, ප්‍රකාශිත සඟරා සහ වාර්ෂික වාර්තා ආදිය මගින් ලබා ගැනීමට කටයුතු කරන ලදී.

මෙම අධ්‍යයනය, තේ වතු කම්කරු ආර්ථිකයක් සහිත කුටුම්භ පාදක කරගෙන සිදුකරන ලදී. ශ්‍රී ලංකාවේ වැඩිම තේ වතු ඝනත්වයක් සහ ව්‍යාප්තියක් නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පවතින අතර නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වැඩිම වතු කම්කරුවන් සංඛ්‍යාවක් සේවයේ නියුක්තව ජීවත්වෙති. එබැවින් මෙම අධ්‍යයනය සඳහා අධ්‍යයන ප්‍රදේශය ලෙස නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තෝරා ගන්නා ලදී. ඒ අනුව දත්ත ලබාගැනීම සඳහා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රේග්ලී වතුයාය (Craigie Lea Estate) තෝරාගන්නා ලදී. ක්‍රේග්ලී වතුයාය තුළ පවතින උප අංශ තුලින් සරල සසම්භාවීව, නියැදිය 100 ක් වන ආකාරයට තෝරා ගන්නා ලදී.

*වගුව 2 - නියැදිය තෝරා ගැනීම*

| වතු කොටස | මුළු පවුල් සංඛ්‍යාව | වතු කම්කරු පවුල් සංඛ්‍යාව | නියදියට අයත් පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|
| Craigie Lea (CL) | 354 | 157 | 46 |
| Forest Creek (FC) | 288 | 128 | 38 |
| Fethily (FL) | 131 | 55 | 16 |
| එකතුව | 733 | 340 | 100 |


*මූලාශ්‍රය : නියැදි දත්ත (2019)*

### 4. දත්ත විශ්ලේෂණය

රැස්කරන ලද දත්ත SPSS මෘදුකාංගය තුලට ඇතුලත් කර දත්ත විශ්ලේෂණය සිදු කර ඇත. ඒ අනුව අරමුණු සාධනය කර ගැනීම සඳහා විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රමවේදයන් මගින් දත්ත විශ්ලේෂණය සිදු කර ඇත. ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තු ගිණුම්වලට අනුව සාමාජිකයන් පස්දෙනෙකුගෙන් යුත් පවුලකට සාමාන්‍ය ජීවිතයක් ගත කිරීමට මාසයක් සඳහා රු. 54,000/=ක මුදලක් ද ඒ සඳහා වතු අංශය තුළ දී රු. 44,000/= ක මුදලක් ද අවශ්‍ය වේ (දෙරණ අලුත් පාර්ලිමේන්තුව වැඩසටහන, 178 වන වැඩසටහන).

එසේම වතු කම්කරු කුටුම්භයක සාමාන්‍ය ස්ථිර සේවා නියුක්ත සංඛ්‍යාව දෙදෙනෙකුට ආසන්න වන අතර එබැවින් එක් සාමාජිකයෙකු සඳහා මාසික වැටුප රු. 26,975/= ක් විය යුතු අතර දෛනික වැටුප රු. 1,108/= ක් ලෙස වැඩි විය යුතු ය. නමුත් වර්තමාන දෛනික වැටුප රු. 750/= ට ආසන්න වේ. තේ වතු කම්කරු ආර්ථිකයක් සහිත වතු කුටුම්භවල ආර්ථික පසුබිම මෙම අධ්‍යයනය තුළ දී හඳුනාගැනීම සිදු කරයි. කුටුම්භයක ආර්ථික පසුබිම සඳහා එම කුටුම්භයෙහි සාමාජික සංඛ්‍යාව විශාල බලපෑමක් සිදුකරනු ඇත.

*ප්‍රස්තාර සටහන 1 - තේ වතු කම්කරු කුටුම්භවල සාමාජික සංඛ්‍යාව*





*මූලාශ්‍රය : නියැදි දත්ත (2019)*

තේ වතු කම්කරු කුටුම්භයන්ගේ සාමාජික සංඛ්‍යාව ව්‍යාප්තව ඇති ආකාරය ප්‍රස්තාර සටහන 1 මගින් දැක්වේ. ඒ අනුව වැඩිම කුටුම්භ සංඛ්‍යාවක සාමාජිකයින් පස්දෙනෙකු බැගින් වන අතර එහි ප්‍රතිශතය 28% ක් පමණ වේ. සාමාජිකයින් හත් දෙනෙකු බැගින් සිටින කුටුම්භ ප්‍රතිශතය 23% ක් වන අතර පිළිවෙළින් සාමාජිකයන් හය දෙනකු සහ හතර දෙනෙකු බැගින් ජීවත්වන කුටුම්භ ප්‍රතිශතය 21% ක් සහ 18% ක් ලෙස පවතී. සාමාජිකයන් තිදෙනකු සහිත කුටුම්භ ප්‍රතිශතය 10% ක් වේ. තේ වතු කම්කරු කුටුම්භයක සාමාන්‍ය සාමාජික සංඛ්‍යාව පස් දෙනෙකුට ආසන්න වන අතර එය එක් සාමාජිකයෙකුගෙන් වෙනස්වීමේ හැකියාවක් පවති ( $\bar{X} = 2.61, S = .984$). ඕනෑම කුටුම්භයක ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික පසුබිම නිර්මාණය වීම තුළ දී ප්‍රධාන සාධකය ලෙස දෙමාපියන්ගේ අධ්‍යාපනික පසුබිම හඳුනාගත හැකි ය.

තේ වතුකරයේ කුටුම්භවල දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම ප්‍රස්තාර සටහන 2 මගින් දැක්වේ. ඒ අනුව වතු ක්ෂේත්‍රයේ කුටුම්භවල කාන්තාවන් 14% ක් සහ පුරුෂයන් 12% ක පිරිසක් කිසිදාක පාසල් ගොස් නොමැත. වතු ක්ෂේත්‍රයේ සමස්ත කුටුම්භ අතරින් කුටුම්භ 13% ක දෙමාපියන් ප්‍රතිශතයක් කිසිදාක අධ්‍යාපන සඳහා පාසලට සහභාගී නොවී ඇති අතර 5 ශ්‍රේණියෙන් පසුව අධ්‍යාපනය නතර කළ පිරිස 26% කි. 8 ශ්‍රේණියේ දී 48% ක ප්‍රතිශතයක් අධ්‍යාපන නතර කර ඇති අතර එම ශ්‍රේණියේ අවසානයේ දී සමස්ත දෙමාපියන්ගෙන් 87% ක ප්‍රතිශතයක් අධ්‍යාපනයෙන් විතැන් වී ඇත. 11 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනයට සහභාගීවූ ප්‍රතිශතය 13% කි.


*ප්‍රස්තාර සටහන 2 - තේ වතු කම්කරු කුටුම්භවල දෙමාපියන්ගේ අධ්‍යාපන සංයුතිය*




*මූලාශ්‍රය : නියැදි දත්ත (2019)*

දෙමාපිය අධ්‍යාපන සාධනය පිළිබඳව විශ්ලේෂණය කිරීමේ දී ඔවුන් වෙත ලැබුණු පහසුකම් පිළිබඳව අවධානය යොමුකළ යුතු ය. නිදහස් අධ්‍යාපනය ලංකාවට 1940 දශකයේ හිමිවන අතර වතු ක්ෂේත්‍රය සඳහා නිදහස් අධ්‍යාපනය 1980 දශකය තුළ දී හිමිවිය. ඒ අනුව ඔවුන් ලංකාවේ සෙසු සමාජයන්ට සාපේක්ෂව දශක හතරක පමණ පසුගාමිත්වයකින් යුතුව අධ්‍යාපන කටයුතු ආරම්භ කර ඇත (දෙරණ අලුත් පාර්ලිමේන්තුව, 178 වන වැඩසටහන). ඒ අනුව වතු ක්ෂේත්‍රයේ දෙමාපියන්ගේ අධ්‍යාපන සාධන මට්ටම ඉතා පහළ අගයක් ලබාගෙන ඇත. එම නිසා ම මෙම දෙමාපියන් වතු ක්ෂේත්‍රය තුළ රැඳී සිටින අතර ආර්ථිකමය වශයෙන් සහ සමාජමය වශයෙන් පසුගාමී තත්ත්වයක් දැකගත හැකි ය. මෙම අධ්‍යයනය සිදු කරනුයේ මූලිකවම තේ වතු කම්කරු කුටුම්භ පාදක කර ගැනීමෙන් ය. ඒ අනුව මෙම කුටුම්භයන්ගේ මූලිකම ආර්ථික උපාය මාර්ගය ලෙස තේ වතු කම්කරුවන් ලෙස සේවා නියුක්ත වීම හඳුනා ගත හැකි ය.

*ප්‍රස්තාර සටහන 3 - තේ වතු කම්කරු කුටුම්භවල ස්ත්‍රී-පුරුෂභාවය අනුව සේවා නියුක්තවීමේ සංයුතිය*





*මූලාශ්‍රය : නියැදි දත්ත (2019)*

කුටුම්භ තුළ තේ වතු කම්කරු සේවා නියුක්ති සාමාජික සංඛ්‍යාව, ස්ත්‍රී-පුරුෂභාවය අනුව බෙදී ඇති ආකාරය ප්‍රස්තාර සටහන 3 මගින් දැක්වේ. ශ්‍රී ලංකාවේ ඉහළම කාන්තා සේවා නියුක්තභාවය තේ කර්මාන්තය ආශ්‍රිතව පවතින අතර ඉහළම ඝනත්වයකින් යුතුව තේ කර්මාන්තය පවතින නුවරඑළිය දිස්ත්‍රික්කය, ඉහළම කාන්තා සේවා නියුක්ත දිස්ත්‍රික්කය ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව සේවා නියුක්ත සංඛ්‍යාවෙන් 53% ක ප්‍රතිශතයක් කාන්තාවන් වන අතර 47% ක් පුරුෂ පාර්ශවය වේ.

තේ වතු ක්ෂේත්‍රය තුළ කුටුම්භ සාමාජිකයන්ගේන්, තේ වතු කම්කරුවකු වශයෙන් සේවා නියුක්ත වීම කුටුම්භයකින් දෙදෙනෙකුට ආසන්න වේ ($\bar{X}$ = 1.9000). Sinnathamby සහ Vijesandhiran (2018) ට අනුව තේ වතු කම්කරු කුටුම්භයක සාමාන්‍ය සේවානියුක්ත සංඛ්‍යාව පුද්ගලයන් දෙදෙනෙකුට ආසන්න වේ (1.66). සාමාජිකයන් සේවා නියුක්ත සංඛ්‍යාව හා සේවයේ නියුතු දින ගණන අනුව කුටුම්භ මාසික වැටුප් ආදායම තීරණය වේ. රජය, තේ වතු හිමිකාරීත්වය, රාජ්‍ය නොවන සංවිධාන ආදියෙහි මැදිහත්වීම මත, ඉතා පහළ ජීවන මට්ටමක සිටින තේ වතු කම්කරු කුටුම්භ සඳහා නිවාස යෝජනා ක්‍රම දීර්ඝ කාලීනව ක්‍රියාත්මක කරමින් පවතී. මෙම නිවාසයන් අයත් සියළුම ඉඩම් හිමිකාරීත්වය වතු හාම්පුතුන් මත පදනම් වන අතර බොහෝවිට වතු ආශිතව ලයින් කාමර නිවාස දැකගත හැකි ය.

*ප්‍රස්තාර සටහන 4 - තේ වතුකරයේ නිවාසවල සංයුතිය*




*මූලාශ්‍රය : නියැදි දත්ත (2019)*

වතුකරයේ නිවාසවල ස්වභාවය ප්‍රස්තාර සටහන 4 තුලින් දැක්වේ. ඒ තුලින් 76% ක් වන කුටුම්භ ප්‍රතිශතයක් ලයින් කාමර සහිත නිවෙස්වල ජීවත් වෙති. කුටුම්භ 16% ක ප්‍රතිශතයක් තාවකාලික නිවාසවල ජීවත්වන අතර 8% ක කුටුම්භ ප්‍රතිශතයක් ස්ථිර නිවාසවල වාසය කරයි. මෙම නිවාසවලට අයත් භූමි හිමිකාරීත්වය වතු හාම්පුතුන්හට අයත් අයත් වේ. බොහෝ විට පර්චස් 5 කට ආසන්න භූමියක පිහිටා ඇති මෙම ඉඩම, නිවාස ගොඩනැගිල්ල සඳහා පමණක් ප්‍රමාණවත් වෙති.

*වගුව 3 - වතුකරයේ නිවාසවල ස්වාභාවය*


| | | | |
|---|---|---|---|
| නිවාසවල ස්වාභාවය | වහලය | තහඩු | 27.0% |
| | | ඇස්බැස්ටොස් | 73.0% |
| | බිත්තිය | කපරාරුකර ඇත | 90.0% |
| | ගෙබිම | මැටි | 20.0% |
| | | සිමෙන්ති | 80.0% |
| | සනීපාරක්ෂක | | 100.0% |
| | ජලය | | 100.0% |
| | ආලෝකය | | 99.0% |

*මූලාශ්‍රය : නියැදි දත්ත (2019)*

3වන වගුවට අනුව සාමාන්‍ය පරිදි මෙම නිවාසවල වහලය සඳහා ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු බහුලවම යොදා ගෙන ඇති අතර එය ප්‍රතිශතාත්මකව 73% කි. 90% ක පමණ නිවාසවල බිත්ති කපරාරු කර ඇති අතර පොළොව සඳහා සිමෙන්ති යොදා ඇති නිවාස ප්‍රතිශතය 80% කි. වර්තමානය වන විට විවිධ යෝජනා සහ ආධාර ක්‍රම මගින් සෑම කුටුම්භයකටම අදාළව වැසිකිලි පහසුකම් සහ විදුලි ආලෝකය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපයා ඇත. මෙම නිවාසයන් සඳහා කිසිදු පිරිවැයකින් තොරව පොදු ස්ථානයකින් ජලය ලබා ගන්නා අතර ඇතැම් කුටුම්භ සඳහා පොදු ස්ථානයේ සිට නළ මාර්ගයෙන් නිවෙස් වෙත ජලය ලබාගෙන ද ඇත.

මෙම වතු කම්කරු කුටුම්භයන්හි ජීවන මට්ටම සඳහා මාසික වැටුප් ප්‍රමාණවත් නොවන බැවින් බොහෝ වතු කම්කරු කුටුම්භ තේ වතු කම්කරු සේවයෙහි නියුක්ත වන අතර ඔවුන් හෝ පවුලේ සාමාජිකයෙකු විසින් හෝ අමතර ආදායම් මාර්ග වෙත, තම කාලය සහ ශ්‍රමය යෙදවීම හඳුනා ගත හැකිය. ඇතැම් අවස්ථාවල කුටුම්භ දෙමාපියන් වතු කම්කරු සේවය සඳහා සහභාගී වන අතර වැඩිමහල් දරුවන් හෝ පවුලේ වෙනත් සාමාජිකයෙකු විසින් හෝ අමතර ආදායම් මාර්ගයෙහි නියුතු වීම හඳුනා ගත හැකි ය.

*ප්‍රස්තාර සටහන 5 - වතු කම්කරු කුටුම්භ අමතර ආදායම් මාර්ගයක් වෙත යොමුවීම*





*මූලාශ්‍රය : නියැදි දත්ත (2019)*

වතු කම්කරු කුටුම්භ, අමතර ආදායම් මාර්ගයක් වෙත යොමුවීම හා යොමු නොවීම, ප්‍රස්තාර සටහන 5 මගින් දැක්වේ. ඒ අනුව 89% ක කුටුම්භ ප්‍රතිශතයක් අමතර ආදායම් මාර්ග වෙත යොමුවී ඇති අතර 11% ක කුටුම්භ ප්‍රතිශතයක් වතු කම්කරු සේවයේ පමණක් රැඳී සිටී.

අධ්‍යයනය සඳහා සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා වලට අනුව තේ වතු කම්කරු සේවය තුළ දී ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශවයම පෙරවරු 7.30 කාලය වන විට සේවය සඳහා වාර්තා කළ යුතු අතර මධ්‍යහ්න 12.30 සිට පස්වරු 1.30 දක්වා දිවා ආහාරය සඳහා කාලය හිමිවේ. මෙයින් අනතුරුව බොහොමයක් පුරුෂ පාර්ශවය සඳහා දෛනික සේවා කාලය හමාර වන අතර කාන්තාවන් පස්වරු 4.30 ට සේවය නතර කර තේ දළු භාර දීම සිදු කළ යුතු ය (දෙරණ අලුත් පාර්ලිමේන්තු, 178 වන වැඩසටහන). මේ අනුව දවල් ආහාර ලබා ගැනීමේ කාලය සහ ඉන් අනතුරුව සේවාව හමාර කරන පුරුෂ පාර්ශවය හෝ කුටුම්භයේ වෙනත් පාර්ශවයක් විසින් අමතර ආදායම් ඉපයීම සඳහා යොමුවී ඇත.


*ප්‍රස්තාර සටහන 6 - වතු කම්කරු කුටුම්භ අමතර ආදායම් මාර්ග වෙත යොමු වීමේ සංයුතිය*




*මූලාශ්‍රය : නියැදි දත්ත (2019)*

ප්‍රස්තාර සටහනට 6 මගින් අමතර ආදායම් මාර්ගය වෙත යොමු වී සිටින 89% ක කුටුම්භ ප්‍රතිශතය තුලට ආදායම් ලැබෙන ආකාරය දැක්වේ. ඒ අනුව 8% ක ප්‍රතිශතයක් තාවකාලික රැකියා සඳහා යොමු වී ඇති අතර ඒ තුළ දී සාම්ප්‍රදායිකව තේ වතු සේවානියුක්තභාවයෙන් ඉවත් වු තරුණ ප්‍රජාව හඳුනාගත හැකි ය. කුටුම්භ 20% ක ප්‍රතිශතයක් ගෙවතු වගාව ආශ්‍රිතව ද 22% ක ප්‍රතිශතයක් සත්ත්ව පාලනය තුලින් ද අමතර ආදායම් ලබති. මොනයම් හෝ ආධාරයක් ලබන ප්‍රතිශතය 10% ක් වන අතර ඉහත ආදායම් මාර්ග අතරින් දෙකක් හෝ කිහිපයක් ලබන කුටුම්භ ප්‍රතිශතය 40% ලෙස හඳුනාගත හැකි ය.

*ප්‍රස්තාර සටහන 7 - වතු කම්කරු කුටුම්භ වෙත අමතර ආදායම් ලැබීම් සංයුතිය*





*මූලාශ්‍රය : නියැදි දත්ත (2019)*

විවිධ ක්ෂේත්‍ර තුලින් ලැබෙන අමතර ආදායම් ප්‍රමාණනය කර, ප්‍රස්තාර සටහන 7 මගින් ඉදිරිපත් කර ඇත. ඒ අනුව අමතර ආදායම් මාර්ග වෙත යොමුවී ඇති කුටුම්භ 89% ක ප්‍රතිශතය අතුරින් 39% ක කුටුම්භ ප්‍රතිශතයක් රු. 2500 ට වඩා අඩු ආදායමක් අමතර ආදායම් මාර්ග තුලින් ලබන අතර රු. 2500-5000 අතර ආදායම් උපයන ප්‍රතිශතය 38% කි. තේ වතු කම්කරු කුටුම්භ 15% ක ප්‍රතිශතයක් රු. 5000 - 7500 ත් අතර ආදායමක් මාසිකව අමතර ආදායමක් ලෙස උපයන අතර රු. 7500 ඉහළ ආදායමක් ලබන කුටුම්භ ප්‍රතිශතය 8% ක් පමණ වේ.

සමාන්‍යයෙන් ඕනෑම සමාජයක පුද්ගලයෙක් කුටුම්භයක දෛනික කටයුතු පවත්වා ගැනීම සඳහා සහ විශේෂිත අරමුණු සාර්ථක කර ගැනීම සඳහා පවතින දුෂ්කරතා මඟ හරවා ගැනීම පිණිස ණය ගනුදෙනු යොදාගනු ලබයි.

*ප්‍රස්තාර සටහන 8 - වතු ක්ෂේත්‍රයේ කුටුම්භ ණය ගනුදෙනු*




*මූලාශ්‍රය : නියැදි දත්ත (2019)*


වතු කම්කරු කුටුම්භ ණය ලබා ගැනීම සහ ලබා නොගැනීම, ප්‍රස්තාර සටහන 8 මගින් දැක්වේ. ඒ අනුව සමස්ත කුටුම්භ සංඛ්‍යාවෙන් 84% ක ප්‍රතිශතයක් ණය ලබා ගෙන ඇති අතර 16% ක ප්‍රතිශතයක් ණය ලබා ගෙන නොමැත.

ඉතිරිකිරීම් හා ණය ගැනීම් යන අංශ ද්විත්වයම නොමැති කුටුම්භ වැඩි ප්‍රතිශතයක් වතුකරය තුළ  පවතී. විශේෂයෙන් ම ප්‍රධාන සාමාජිකයන් විශ්‍රාමික වූ කුටුම්භවල මෙම ලක්ෂණය දක්නට ලැබේ. සෙසු ණය එදිනෙදා අවශ්‍යතා සඳහා ගත් ඒවා වේ. කාන්තා සමිති ක්‍රියාත්මක වන අතර සීට්ටු ක්‍රමය ද ඉතිරිකිරීමේ ක්‍රමයක් ලෙස හඳුනාගත හැකිවිය. මෙහි දී සාමාජිකයන් 10 ක් ඒ සඳහා යොදාගෙන ඇත. කාන්තාවන් විසින් පවුලේ ආර්ථික මට්ටම ඉහළ නංවා ගැනීම සඳහා විශාල මෙහෙයක් සිදුකරන අතර ඔවුන්ගේ ආභරණ සුරක්ෂිතව තබා අවශ්‍ය අවස්ථාවල දී උකස් කිරීම මගින් හදිසි මුදල් අවශ්‍යතා සපුරාගනු ලබයි (ජයවර්ධන, 2008).

අධ්‍යයනය සඳහා සිදු කරන ලද සම්මුඛ සාකච්ඡාවලට අනුව මෙම වතුකම්කරු කුටුම්භ ආකාර කිහිපයක් තුලින් ණය සේවා ගනුදෙනු ලබාගැනීම සිදු කරයි. කුටුම්භ බොහොමයක් මාසයක් පුරා තෝරාගත් වෙළඳසැලකින් ණය සේවා ගෙවීමේ ක්‍රමය තුළ භාණ්ඩ ලබා ගන්නා අතර මාසික වේතන දිනයට එය පියවීම සිදු කරනු ලබයි. බොහෝ විට එහිදී ඉතිරි වීමක් හෝ හිඟ වීමක් නොවේ. තව ද තේ වතු හිමිකාරීත්වය තුලින් ද යම් යම් ද්‍රව්‍යය ලබා ගන්නා අතර එය මාසික වේතනයෙන් අඩු කරනු ලැබේ. මෙම වතු කම්කරු කුටුම්භ විශේෂ අරමුණින් ලබාගන්නා ණය සේවා ප්‍රමාණ ඉතාම පහළ අගයක් ගන්නා අතර එදිනෙදා කටයුතු සඳහා ණය ගැනීම සිදුවේ.

වතු කම්කරු කුටුම්භයක සමස්ත මාසික වියදම කොටස් කිහිපයකින් නිර්මාණය වේ. එනම් ආහාර, නිවාස, ආහාර හා නිවාස නොවන සහ අනපේක්ෂිත වියදම් වේ (Sinnathamby & Vijesandhiran, 2018). වියදම එකිනෙක කුටුම්භ තුලින් වෙනස්වන්නේ මූලිකවම අධ්‍යාපන වියදම පදනම්ව වේ.

*ප්‍රස්තාර සටහන 9 - තේ වතු කම්කරු කුටුම්භයක අධ්‍යාපන වියදම*




*මූලාශ්‍රය : නියැදි දත්ත (2019)*

තේ වතු කම්කරු කුටුම්භයක මාසික වියදම් අතුරින් අධ්‍යාපනය සඳහා වන දළ මාසික වියදම ප්‍රස්තාර සටහන 9 මගින් දැක්වේ. ඒ අනුව 22% ක කුටුම්භ ප්‍රතිශතයක් අධ්‍යාපනය සඳහා මාසිකව රු. 1,500 අඩු පිරිවැයක් වෙන් කරන අතර කුටුම්භ 37% ක ප්‍රතිශතයක් රු.1,500-3,000 ත් අතර පිරිවැයක් අධ්‍යාපනය සඳහා වෙන් කරයි. කුටුම්භ 23% ක ප්‍රතිශතයක් අධ්‍යාපනය සඳහා මාසිකව රු.3,000-4,500 ත් අතර මුදලක් වියදම් කරන අතර රු. 4,500 ට වැඩි පිරිවැයක් අධ්‍යාපනය සඳහා ආයෝජනය කරන ප්‍රතිශතය 18% කි.

කුටුම්භයක් විසින් වෙන් කරන මාසික අධ්‍යාපන වියදම මූලිකව ම කුටුම්භයන්ගේ අධ්‍යාපනය ලබන සිසුන් ප්‍රමාණය මත පදනම් වීමකට වඩා ඔවුන් ඉගෙනුම ලබන ශ්‍රේණිය මත පදනම් වන බව සම්මුඛ සාකච්ඡා ක්‍රමය තුළ දී හඳුනාගත හැකි විය. ඒ අනුව ප්‍රධාන වශයෙන් ම පාසල් අධ්‍යාපනය සඳහා සැලකිය යුතු පිරිවැයක් නොලැබුව ද බාහිර උපකාරක පන්ති වෙත යොමු වීම සහ සහභාගීවන පන්ති ප්‍රමාණය ආදිය මත කුටුම්භ අධ්‍යාපන පිරිවැයෙහි වෙනස්වීම හඳුනාගත හැකි ය.

**5. සමාලෝචනය**

වතු කම්කරු කුටුම්භයක සාමාන්‍ය සාමාජික සංඛ්‍යාව පස් දෙනකුට ආසන්න වේ. ඒ අතුරින් ස්ථිර සේවා නියුක්තිභාවයෙන් යුත් සාමාජිකයන් දෙදෙනෙකු ට ආසන්න ප්‍රමාණයක් සිටින අතර එම සේවා නියුක්ත වීම තේ වතු අංශය තුළ පවතී. රටේ සෙසු සමාජ වල කාන්තා සේවා නියුක්තිය ඉතාම පහළ අගයක් ලබා ගත්ත ද තේ වතු කර්මාන්තය ආශ්‍රිතව ලංකාවේ ඉහළම කාන්තා සේවා නියුක්තික තත්ත්වයක් පවතී. ඒ අනුව මේ තුළ ද කාන්තා සේවා නියුක්තභාවය ඉහළ අගයක් ගෙන ඇත.

තේ වතුකර නිවාස 76% ක් පමණ ලයින් කාමර නිවාස ලෙස පවතී. තාවකාලික නිවාස ලෙස 16%ක ප්‍රතිශතයක් පවතින අතර මෙම තත්ත්වය වෙනස් කිරීමට රජය හා රාජ්‍ය නොවන සංවිධාන මැදිහත්ව ඇත. මෙම නිවාසවල වහලය සඳහා බහුතරය ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු භාවිතා කර ඇති අතර බිත්ති කපරාරු කර පොළව සඳහා සිමෙන්ති යොදා ඇත. වර්තමානය වන විට වතු සනීපාරක්ෂා කටයුතු වර්ධනය වී ඇති අතර සෑම නිවසක් සඳහා ම වැසිකිළි පහසුකම් ලබාදීම සඳහා රජය මැදිහත් වී ඇත. ජලය සහ විදුලිය සෑම නිවසකටම ලැබී ඇත. නමුත් මෙම බහුතර භූමි හිමිකාරීත්වය වතු සමාගම් සතු වේ.

තේ වතු කම්කරු වැටුප මාසික වියදම සඳහා ප්‍රමාණවත් නොවන බැවින්, අමතර ආදායම් මාර්ග වෙත කුටුම්භ යොමුවී ඇත. ඒ අනුව ගෙවතු වගාව, සත්ත්ව පාලනය, තාවකාලික රැකියා ආදිය මගින් මාසික ආදායම ඉහළ නංවා ගෙන ඇත. වර්තමානයේ වතුකරයේ තරුණ ප්‍රජාව දෙමාපිය රැකියාව වන තේ වතු සේවයෙන් බැහැරව, තාවකාලිකව ශ්‍රමය සංචලනය කරමින් රැකියාවල නියුක්තව ඇත. මෙම ප්‍රජාවගේ මානව සම්පත්වල ගුණාත්මකභාවය පහළ බැසීම නිසා ස්ථිර රැකියාවක් තුළ සේවා නියුක්තවීමට හෝ ඉහළ ආදායම් මාර්ගයක් තුළ සේවා නියුක්තවීමට අවස්ථාව ලැබී නොමැත. මෙය වතුකරයේ කුටුම්භ තුළ අඛණ්ඩ දරිද්‍රතාවය සඳහා බලපෑම් කර ඇත.

සාමාන්‍ය සමාජයක ණය පහසුකම් සුවිශේෂී අරමුණක් සහිතව ලබා ගනු ලැබේ. නමුත් වතු ක්ෂේත්‍ර කුටුම්භ ණය තුළ සුවිශේෂී අරමුණක් නොමැති අතර දෛනික ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සපුරාලීම සඳහා ණය පහසුකම් ලබාගෙන ඇත. පාසල් අධ්‍යාපනයෙන් පසුව සේවා නියුක්තවීමට පෙර වෘත්තීය අධ්‍යාපනය වෙත යොමුවීමක් වතු අංශය තුළ හඳුනාගත නොහැකි වේ. එය එම කුටුම්භ තුළ අඛණ්ඩ දරිද්‍රතාවයට බලපා ඇත. එබැවින් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, සමාජ සවිබලගැන්වීම් සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය, නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය ආදිය සම්බන්ධිතව පාසල් අධ්‍යාපනය තුළදී ම සිසුන් සහ දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ඒ සඳහා යොමුවීමට අවශ්‍ය පහසුකම් සැලසීම මගින් මෙම තත්ත්වය වෙනස් කර ගත හැකි වේ.

ආරම්භයේ සිට වතුකරයේ නිවාස සහ සමාජ තත්ත්වය පහළ මට්ටමක පැවතිණි. වර්තමානය දක්වා ද වතු නිවාස ඉඩම් හිමිකාරිත්වය එම කුටුම්භ වෙත නොපවතී. එබැවින් එම කුටුම්භ වෙත සුදුසු ක්‍රමයක් තුළ ඔප්පු ප්‍රදානය, නිවාස හා සනීපාරක්ෂක යෝජනා ක්‍රම ආදිය සංවර්ධනය කිරීම පිළිබඳව රජය, පෞද්ගලිකාංශය සහ වතු හිමිකාරීත්වය එක්ව සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කල යුතු ය. එසේම වතුකරය තුළ යෞවන සමාජ, ක්‍රීඩා සමාජ ආදිය මගින් සමාජ සවිබල ගැන්වීම හරහා වතුකරයේ සමාජ තත්ත්වය ගොඩනැංවීමට හැකි වේ.

වතු කම්කරු කුටුම්භවල ආර්ථික තත්ත්වය ගොඩනැංවීම සඳහා රජය, වතු කම්කරු වෘත්තීය සමිති සහ වතු හාම්පුතුන්ගේ සංගමය එක්ව කටයුතු කල යුතු ය. වර්ෂ දෙකකට වාරයක් අත්සන් තබන සාමූහික ගිවිසුම සඳහා රජය මැදිහත් විය යුතු වේ. ඒ අනුව අහෝසි කරන ලද පැමිණීමේ දීමනාව සහ දිරි දීමනාව නැවත ලබාදීම, දෛනික වැටුප ආසන්න වශයෙන් රු. 1,000/= ක් දක්වා ඉහළ නැංවීම සඳහා මැදිහත්වීම සිදුකල යුතු ය. අධ්‍යාපනය ලබන වයසේ දරුවන් සහිත කුටුම්භ වෙත විශේෂ අවධානයක් යොමුකල යුතු අතර ඒ සඳහා මූල්‍ය, ද්‍රව්‍ය සහ මනෝවිද්‍යාත්මක ආධාර ලබා දෙන සංවිධාන මගින් දිරිගැන්වීමෙන් මෙම කුටුම්භයන්හි ආර්ථික තත්ත්වය සහ අධ්‍යාපන තත්ත්වය ගොඩනැංවිය හැකි වේ. තව ද

මෙම කුටුම්භයන් සඳහා අමතර ආදායම් මාර්ග හඳුන්වාදීම සහ පවතින අමතර ආදායම් මාර්ග සංවර්ධනයට අවශ්‍ය මානව සම්පත් දායකත්වය ලබාදීම තුලින් වතු කම්කරු කුටුම්භයන්ගේ ආර්ථිකය ගොඩනැංවීම සහ සංවර්ධනය කල හැකි වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


ජයවර්ධන, එන්. සී. එස්. (2008). වතු අංශයේ ජනතාවගේ මානව සම්පත් සංවර්ධනය (බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්).

පියරත්න, ඒ. (2005). වතු කම්කරුවා සහ වෙනස්වන ජීවන රටාව, *විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, මුල්ලේරියාව.*

රත්නායක, එච්. පී. එන්. එන්. (2016). වතු ප්‍රජාවගේ දරුවන්ගේ අධ්‍යාපන කුසලතා සහ ආර්ථිකමය බලපෑම. *ශාස්ත්‍රීය ලිපි සංහරහය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*

Selvarathnam, P. R. and pathmeswaram, A. (2003). *Nurtitional State and Productivity of Sri Lanka Tea Pluckers.* Ceylon Medical Journal.

Sinnathamby, M. and Vijesandirana, S. (2018). *Living Wage for the Sri Lankan Tea Estate Workers.* Institute of Social Development, Kandy, Sri Lanka.

Thibbotuwawa, M., Jayawardena,P., Arunatilake, N. and Gunasekera, N. (2015). *Living Wage Report Sri Lanka Estate Sector Context Provided in the Tea Sector*. The Global Living Wage Coalition.

UNICEF Sri Lanka. (2013). *Out of School Children in Sri Lanka, Country Study*